# පරීක්ෂක වාර්තාව

පදනම් විභාගය - ජූලි 2014

## (57) ව්‍යාපාර සන්නිවේදනය - I

(Business Communication - I)

---

මෙවර ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා තිබූ අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් ඉහළ ලකුණු ලබාගැනීමට සමත් වූහ. එසේ වුවත් ඇතැම් අයගේ පිළිතුරු ලිවීමේ ප්‍රවනතාවයේ තරමක පසුබෑමක් දක්නට ලැබුණි. එසේ වීමට හේතු වශයෙන් උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයට ලක්වූ ඇතැම් දුර්වලතා පහත දැක්වේ.

## A - කොටස

(ලකුණු 50)

### ප්‍රශ්න අංක **01** - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය කොටස් 3 කින් සමන්විත වන අතර ව්‍යුහගත ශෛලියක් යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ඒ අනුව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ට නිරීක්ෂණය වූ පහත දැක්වෙන අඩුපාඩු දැක්විය හැකිය.

(a) මෙම කොටසට ඉතාම සරල පිළිතුරකින් සම්පූර්ණ ලකුණු ලබා ගත හැකි වුවද එම ලකුණුද අහිමි කර ගත් අයදුම්කරුවන් පිරිසක් විය. න්‍යායාත්මක දැනුම මිස ප්‍රායෝගික බවක් අයදුම්කරුවන් තුළ නොවීම ඊට හේතුවයි. පැහැදිලි හොඳ ප්‍රශ්නයක් වුවද අයදුම්කරුවන් තුළ වූ අවබෝධය අඩු බව පෙනුණි.

(b) මෙම කොටසින් ලිඛිත සන්නිවේදන ක්‍රම පිළිබඳ විමසා තිබූ අතර අපේක්ෂිත පිළිතුරු අදාලව අයදුම්කරුවන්ගේ පිළිතුරු ප්‍රමාණවත් නොවීය. ක්‍රම වශයෙන් විවිධ සන්නිවේදන ක්‍රම සඳහන් කර තිබූ අතර අපේක්ෂා කළ උදාහරණ සඳහන් නොකිරීම ලකුණු අඩු වීමට හේතු විය.

(c) මෙම කොටසට බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා ලකුණු ලබාගෙන තිබුණි.

### ප්‍රශ්න අංක **02** - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

කොටස් දෙකකින් සමන්විත මෙම ප්‍රශ්නය නිවැරදි ලෙස තේරුම් ගත් අයදුම්කරුවන් වැඩි සංඛ්‍යාවක් සිටි අතර, ප්‍රශ්නය තේරුම් නොගත් සුළු අයදුම්කරුවන් පිරිසක්ද විය. ඒ අනුව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ට නිරීක්ෂණය වූ පහත දැක්වෙන අඩුපාඩු දැක්විය හැකිය.

(a) (i) කරුණු ලිවීම වෙනුවට ඡේද ලිවීම.

(ii) ලිඛිත හා වාචික යන වචන දෙක වරදවා තේරුම් ගැනීම.

(iii) පිළිතුරු ලිවීමට උත්සහා නොගත් අයදුම්කරුවන් ද සිටීම.

(iv) වාචික සන්නිවේදනයේ ඇති වාසි පමණක් ලියා ඇති අතර සංසන්දනාත්මකව ලියා නොතිබීම.

(b) ප්‍රශ්නය සඳහා ඉදිරිපත් කොට තිබූ පිළිතුරු ඉතා සාර්ථක යැයි කිව නොහැක. රැස්වීම පැවැත්වීමට උපදෙස් පිළිබඳව ප්‍රායෝගිකව වටහා ගෙන තිබූ බවක් නොතිබුණි. සමහරු දීර්ඝ ලෙස පිළිතුරු ලියා තිබුණි. ප්‍රශ්නය හොඳින් කියවා ප්‍රශ්නයට අදාල නිවැරදි කරුණු කෙටියෙන් ලිවීම පිළිබඳව අයදුම්කරුවන් සැලකිල්ලට ගත යුතුය.

### ප්‍රශ්න අංක **03** - ලකුණු 15
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ප්‍රස්තාරයක් අදාල කර ගනිමින් මැමෝ පත්‍රයක් ලිවීමට තිබූ ප්‍රශ්නයකි. වැඩි අයදුම්කරුවන් පිරිසක් ප්‍රශ්නය පිළිබඳ මනා අවබෝධයක් ලබා තිබුණු බව දක්නා ලදී. මැමෝ ආකෘතිය පිළිබඳව ද අයදුම්කරුවන් තුල තිබූ දැනුම සතුටුදායකය. සුළු අයදුම්කරුවන් පිරිසක් ලිපියක ආකෘතිය යොදාගෙන තිබුණි. ප්‍රස්තාරය අධ්‍යනය කර ගනිමින් අදාල ලෙස කරුණු ඉදිරිපත් කරමින් අවබෝධයකින් යුතුව පිළිතුරු ලියා තිබුණි. සමහර පිළිතුරු වල "මුහුණ දීමට සිදුවූ අභියෝග" පිළිබඳව කරුණු ඉදිරිපත් නොවීය. බොහෝ පිළිතුරු වල අදාල කරුණු බොහොමයක් ඇතුලත් වීම නිසා වැඩි දෙනෙකුට වැඩි ලකුණු ලැබීමට අවස්ථාව ලැබුණි.

### ප්‍රශ්න අංක **04** - ලකුණු 15
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

"වාර්තාවක්" යන වචනයේ අර්ථය පමණක් ගැන සිතා ආකෘතික ලක්ෂණ ගැන නොසිතා කරුණු ඉදිරිපත් කළ පිළිතුරු බොහෝ සංඛ්‍යාවක් විය. ඒ නිසා ආකෘතියට හිමිවිය යුතු ලකුණු එම පිළිතුරු පත් වලින් ගිලිහී යාමද ලකුණු අඩුවීමට හේතුවක් විය. විෂය දැනුම වැඩි වශයෙන් තිබූ අයදුම්කරුවන් උපරිම ලකුණු ලබාගෙන තිබූ අතර, අනෙක් ප්‍රශ්න හා සැසඳීමේදී ප්‍රශ්නයට හිමි ලකුණු ප්‍රමාණයෙන් වැඩිම සංඛ්‍යාවකට වැඩි ලකුණු ලබා ගත් ප්‍රශ්නයක් විය.

## <u>Section - B</u>

*(Answers to this Section **should be** in the English medium by all candidates)*

(50 marks)

Most of the candidates had answered well. All these questions are familiar with them. But in answering the grammar question some had gone wrong. They had no proper understanding about the relevant grammar forms.

### Question No. 05 - 10 marks

Most of the candidates had scored good marks. A few had not performed well as they had not a basic knowledge about adjectives. Some candidates failed to understand the instructions given in the question. They had written numbers instead of the verb form given within brackets. Not only for this question, it was same other questions also.

It is clear that the candidates should practise these type of activities to understand adjectives.

### Question No. 06 - 10 marks

In the question most of the candidates managed to score good marks. But it was noted that some candidates didn't have selected the correct form of the verb.

To make candidates familiar with the verb forms they should be advised to read English books, Magazines, Novels and News Papers.

## Question No. 07 & 08 - each 10 marks

Most of the candidates have answered properly. But few had not performed well. It seems that they don't use English in their day to day work.

To get more success, they should be advised to speak in English when they talk with friends.

## Question No. 09 - 10 marks

Almost all the candidates have scored good marks for this question. But there were a very few candidates scored law marks.

It is necessary to give enough practice by giving similar questions to score more marks.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

(1) පළමුව ප්‍රශ්න පත්‍රයේ ඉහලින්ම ඇති **"අයදුම්කරුවන්ට උපදෙස්"** හොඳින් කියවා දී ඇති උපදෙස් පිළිපැදීමේ ඇති අවශ්‍යතාවය අයදුම්කරුවන් අවධාරණය කර ගත යුතුය.

(2) විශේෂයෙන්ම ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමට පෙර එය හොඳින් කියවා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය මත පදනම්ව එයට සැපයිය යුතු පිළිතුරේ ස්වභාවය නිගමනය කොට පිළිතුරු සැපයීම ආරම්භ කළ යුතුය. එසේ පිළිතුරු සැලසුම් නොකලහොත් අනවශ්‍ය ලෙස දිගු පිළිතුරු ලිවීමට ද පෙළඹේ. එවිට නිශ්චිත පිළිතුරු ගිලිහී ගොස් අනවශ්‍ය කරුණු පවා ලියැවෙන බැවින් වටිනා කාලය ද නාස්ති වන බව අයදුම්කරුවන් දැනුවත් වීම ඉතා වැදගත්ය.

(3) සම්පූර්ණ විෂය නිර්දේශය මනාව අධ්‍යයනය කර තිබීම.

(4) ඉංග්‍රීසි ව්‍යාකරණ පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

(5) ලිපි වර්ග ලිවීමේදී ආකෘතිමය රාමුව ගැන නිවැරදි අවබෝධයක් ඇති කර ගැනීම.

උදා:
- (1) රාජකාරී ලිපි (Official letters)
- (2) ව්‍යාපාරික ලිපි (Business letters)
- (3) මැමෝ පත්‍රය (Memos)
- (4) න්‍යාය පත්‍ර (Agendas)
- (5) දැන්වීම් හා වාර්තා (Advertisements & Reports)
- (6) ආරාධනා පත්‍ර (Invitations)

මෙම ලිපි ගැන නිරන්තර ප්‍රායෝගික අභ්‍යාස වල යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(6) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(7) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(8) උත්තර පත්‍ර බාරදීමට පෙර විභාග අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

(9) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -